# සිංහල ප්‍රශස්ති වර්ණනා සහ එහි අද්‍යතන ස්වරූපය පිළිබඳ විමසීමක්

එම්. ඒ. සෙව්වන්දි[1]

'පැසසීම, ස්තුතිය' යන අර්ථ උපදන ප්‍රශස්ති වර්ණනාවක දී සිදු වනුයේ කිසියම් ගුණ කීර්තනයකි. රජවරුන් හා විවිධ ප්‍රභූවරුන්ගේ ගුණ දක්‍ෂතා ආදිය වර්ණනා කරමින් ඔවුන් සතුටට පත්කිරීම ප්‍රශස්ති නිර්මාණයේ අරමුණ යි. වෛදික යුගයේ පටන් පැවතෙන මේ පුද්ගල වර්ණනා විධික්‍රමය සංස්කෘත, පාලි, ද්‍රවිඩ හා හින්දි ආදි සාහිත්‍ය රැසක විද්‍යමාන වේ. සිංහල සාහිත්‍යයේ දී ප්‍රශස්ති වර්ණනා ගද්‍ය හා පද්‍ය වශයෙන් දෙයාකාර ය. එහි පද්‍ය ස්වරූපයේ ආරම්භක ලක්‍ෂණ සීගිරි ගීයෙන් හඳුනාගත හැකි අතර ප්‍රථම සිංහල ප්‍රශස්ති කාව්‍යය වන්නේ කෝට්ටේ යුගයේ රචිත 'පැරකුම්බා සිරිත' යි. ප්‍රශස්ති වර්ණනාවන්හි ගද්‍ය ස්වරූපය පැරණි සෙල්ලිපිවලින් මෙන් ම 'අමාවතුර, බුත්සරණ' ආදි කෘති විමර්ශනයෙන් ද දැකගත හැකි වේ. කිසියම් සත්පුරුෂයකුගේ යහපත් ගුණයක් ප්‍රශංසාවට ලක්කිරීම උදාර කටයුත්තක් වුව ද නුවර යුගයේ දී රජ හා ප්‍රභූ දෙපාර්ශ්වයන්ගේ ම ව්‍යාජ ගුණාංග අතිශයෝක්තියෙන් වර්ණනා කිරීම හේතුවෙන් ප්‍රශස්ති සාහිත්‍යය ගර්හාවකට ලක් විය. ඒ අනුව දුර්වල ලක්‍ෂණ ප්‍රකට කළ නුවර යුගයේ ප්‍රශස්ති කාව්‍යයන්ගෙන් පසු ව සිංහල ප්‍රශස්ති සාහිත්‍යය අභාවයට ගිය බව සමාජයේ මුල් බැසගත් අදහස යි. ඒ සමාජගත අදහස කෙතෙක් දුරට නිවැරැදි ද, අද්‍යතන සමාජයෙහි ප්‍රශස්ති වර්ණනා නිර්මාණය නො වේ ද, යන කරුණු පිළිබඳ අධ්‍යයනයක නිරත වීම මේ පර්යේෂණයේ අරමුණ යි. ඒ අනුව පැරණි ප්‍රශස්ති සාහිත්‍යික නිර්මාණ හා වර්තමාන දේශපාලනික භූමිකාවන්ගේ ගුණ වැයෙන නිර්මාණ මූලාශ්‍රය වශයෙන් යොදාගනිමින් කරන ලද මේ අධ්‍යයනයේ දී රාජ ස්තුතියක ස්වරූපයෙන් රචනා වූ ප්‍රශස්ති වර්ණනාවන්ට අද්‍යතන සමාජයේ ද වැදගත් තැනක් හිමිවන බව හඳුනාගත හැකි විය. රටෙහි පැවතුණු යුද්ධමය වාතාවරණය ලිහිල් වීමෙන් පසු විවිධ කලාකරුවන් විසින් එවකට රට පාලනය කළ ප්‍රභූ දේශපාලනඥයන් උදෙසා ප්‍රබන්ධ කරන ලද ප්‍රශස්ති වර්ණනා ඒ සඳහා නිදසුන් වේ. ඒ අනුව ප්‍රශස්ති සාහිත්‍යයේ අද්‍යතන ස්වරූපය ලෙස හඳුනාගත හැක්කේ ලැබුවේ දේශපාලන චරිත පදනම් කරගත් 'ගීතය' යි. ඒ ප්‍රශස්ති කොතරම් සුගායනීය වුව ද ජන ප්‍රසාදයට පත් වුව ද නුවර යුගයේ දී තහවුරු වූ 'ප්‍රශස්ති යනු නැති ගුණ වැනුමකි' යන මතය ස්ථිර කරමින් ඒ ප්‍රශස්ති ද තාවකාලික නිර්මාණ විශේෂයක් බව හඳුනාගත හැකි විය.

**ප්‍රමුඛ පදඃ** ප්‍රශස්ති, පැරකුම්බා සිරිත, අතිශයෝක්තිය, දේශපාලන භූමිකා, රාජ ස්තුති

[1] සිංහල අධ්‍යයනාංශය